සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙවන වාර පරීක්ෂණය 2019

7 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- දෙවන කොටසේ පළමු පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

## I - කොටස

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 බුදුන් හා දහම් සරණ ගිය පළමු උපාසකවරුන් වන්නේ,

(1) තපස්සු භල්ලුක දෙදෙනා ය. (2) භද්දවග්ගිය කුමාරවරුන් ය.

(3) ජටිල සහෝදරයින් ය. (4) කොසොල් හා බිම්බිසාර යන රජවරුන් ය.

02 බුදුරජාණන් වහන්සේගේ මංගල ධර්ම දේශනය වන්නේ,

(1) මංගල සූත්‍රයයි. (2) ධම්ම චක්ක පවත්තන සූත්‍රයයි.

(3) අනත්ත ලක්ඛණ සූත්‍රයයි. (4) කරණීයමෙත්ත සූත්‍රයයි.

03 සත් සතිය ගතකළ බුදුරජාණන් වහන්සේ පස්වන සතියේදී සිදුකළ කාර්යය මින් කුමක් ද?

(1) අනිමිස ලෝචන පූජාව (2) රුවන් සක්මන

(3) ධර්මය ගුරුතන්හි තබාගැනීමට තීරණය කිරීම (4) සමාපත්ති සුවයෙන් වැඩ සිටීම

04 බුදුරජාණන් වහන්සේගෙන් ගිලානෝපස්ථානය ලද භික්ෂූන් වහන්සේ නමක් වන්නේ,

(1) ආනන්ද තෙරුන් ය. (2) සුභද්‍ර තෙරුන් ය.

(3) අනුරුද්ධ තෙරුන් ය. (4) පූතිගත්ත තිස්ස තෙරුන් ය.

05 බුදුපියාණන් වහන්සේ ලෝකයෙහි ඇති අතීත, වර්තමාන, අනාගත යන තුන් කාලයට ම අයත් සියලු දේ අත්ලෙහි වූ නෙල්ලි ගෙඩියක් මෙන් මනාව දත් හෙයින්

(1) ලෝකවිදූ නම් වන සේක. (2) සම්මා සම්බුද්ධ නම් වන සේක.

(3) සුගත නම් වන සේක. (4) සත්ථා දේවමනුස්සානං නම් වන සේක.

- **අංක 06 සිට 10 තෙක් දී තිබෙන ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ තිබෙන වරහනෙහි යොදන්න.**

06 දෙගුරුන් වැඳ නිවසින් පිටවීම හොඳ සිරිතකි. ( )

07 මෙත් වඩන්නෙකු තුළ තිබිය යුතු උසස් ගුණාංග 16 ක් කරණීයමෙත්ත සූත්‍රයේ දැක්වේ. ( )

08 ''සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා'' යන්නෙහි තේරුම සියලු සත්වයෝ නිදුක් වෙත්වා යන්නයි. ( )

09 අනේපිඬු සිටුතුමා බුදු සසුනේ අග්‍ර දායකයා ය. ( )

10 අග්‍රශෂ්‍ය දානය යනු මාසිකව දෙනු ලබන දානයයි. ( )

- **අංක 11 සිට 15 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

( ඛුද්දක නිකාය / පූර්වාරාමය / ජේතවනාරාමය / සිඟාලෝවාද සූත්‍රය / අනත්ත ලක්ඛණ සූත්‍රය)

11 විශාඛා උපාසිකාව ............................................................ තනවා බුදු සසුනට පූජා කළා ය.

12 අනේපිඬු සිටුතුමා ............................................................ තනවා බුදු සසුනට පූජා කළේ ය.

13 බුදුරජාණන් වහන්සේ පස්වග භික්ෂූන්ට රහත් බව ලැබීම පිණිස ............................................................ දේශනා කළ සේක.

14 බුදුරජාණන් වහන්සේ සිඟාල ගෘහපතියාට දේශනා කළේ ............................................................ යි.

15 ධම්මපදය සූත්‍ර පිටකයේ ............................................................ ට අයත් වේ.

- **පහත A තීරුවේ දැක්වෙන පාලි වචනයේ අර්ථය B තීරුවෙන් තෝරා පිළිතුරට අදාළ අංකය ඉදිරියේ ඇති වරහනෙහි යොදන්න.**

| | A | | | B |
|---|---|---|---|---|
| 16 | තසා | ( ) | 1. | ඉතා සිහින් සත්වයෝ |
| 17 | ථාවරා | ( ) | 2. | මිටි ශරීර ඇති සත්වයෝ |
| 18 | අවිදූරේ වසන්ති | ( ) | 3. | ළඟ වසන සත්වයෝ |
| 19 | රස්සා | ( ) | 4. | තැති නොගන්නා සත්වයෝ |
| 20 | අනුක | ( ) | 5. | තැතිගන්නා සුළු සත්වයෝ |

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**

01 කෙටි පිළිතුරු ලියන්න.

(i) ඒහි භික්ඛු පැවිද්ද යනු කුමක් ද?

(ii) බුදුරජාණන් වහන්සේගේ දෙවැනි ධර්මදූත පිරිස කවුරුන් ද?

(iii) බුදුරජාණන් වහන්සේගෙන් පිහිට ලැබූ අසරණයින් දෙදෙනෙක් නම් කරන්න.

(iv) කරණීයමෙත්ත සූත්‍රයේ සඳහන් වන මෙත් වඩන්නෙකු තුළ තිබිය යුතු ලක්ෂණ දෙකක් නම් කරන්න.

(v) පන්සිල් පදවලින් පළමු හා දෙවැනි සිල්පද ලියන්න.

(vi) සිඟාලෝවාද සූත්‍රයට අනුව ගුරුවරුන් විසින් සිසුන් වෙනුවෙන් ඉටුකරනු ලබන යුතුකම් දෙකක් නම් කරන්න.

(vii) ඉවසීම යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(viii) බෙදුයෙන් දහම් කඳ - බජනය කෙළෙන් ගුණ කඳ
යන කවියෙහි ඉතිරි පද දෙක ලියන්න.

(ix) සිරිත් විරිත් අනුගමනය කිරීමේ ප්‍රයෝජන දෙකක් ලියන්න.

(x) සිරිත් විරිත් යන දෙකෙහි අරුත් ලියන්න.

(ලකුණු 2 x10 = 20)

02 (i) බුදුරජාණන් වහන්සේගෙන් දහම් අසා සෝවාන් ඵලයට පත්වූ පළමු රජතුමා කවු ද?

(ii) බුදු සිරිතෙහි පළමු වසරේ සිදුවූ සිදුවීම් තුනක් ලියන්න.

(iii) බුද්ධ චරිතයේ පළමු වසරේ සිදුවීම්වලින් හෙළිවන බුද්ධ චරිතයේ සුවිශේෂී ලක්ෂණ දෙකක් පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

03 (i) ''අසවලා මට බැන්නේ ය, මා පරාජය කළේ ය, මා සතු දෙය පැහැර ගත්තේ ය ආදී වශයෙන් නැවත නැවත සිතන තැනැත්තාගේ වෛරය නොසන්සිඳෙන බව'' පෙන්වා දෙමින් දේශනා කළ ධම්ම පද ගාථාව ලියන්න.

(ii) අනුසෝතගාමී හා පටිසෝතගාමී යන වචනවල අර්ථ ලියන්න.

(iii) වෛරයෙන් ඉවත්වීමෙන් සැලසෙන යහපත පිළිබඳ කෙටියෙන් විස්තරයක් ලියන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

04 (i) විරතිය හා සමාදානය වෙන වෙනම හඳුන්වන්න.

(ii) පංචශීලය පිළිබඳ නිවැරදි අවබෝධයක් ඇතිකර ගැනීමේ දී අප අවධානය යොමුකළයුතු අංශ තුන මොනවා ද?

(iii) පංචශීලය ආරක්ෂා කිරීම නිසා සමාජයට සිදුවන යහපත පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

05 (i) ඉවසීමේ ගුණයෙන් අග තනතුර ලැබූ මහරහතන් වහන්සේ කවු ද?

(ii) ඉවසීමෙන් ලැබෙන ආනිසංස තුනක් ලියන්න.

(iii) ඉවසීම නිසා සමාජයේ හොඳින් කටයුතු කළහැකි වන බව කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

06 (i) සහජීවනය යනු කුමක් ද?

(ii) සතර බ්‍රහ්ම විහරණ වලින් තුනක් නම් කරන්න.

(iii) ශ්‍රී ලාංකික සමාජය සහජීවනයෙන් යුතුව ක්‍රියාකරන සමාජයක් බව පෙන්වා දෙන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

07 පහත සඳහන් මාතෘකා වලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(1) කළගුණ සැලකිම

(2) අග්‍ර ශෂ්‍ය දානය

(3) විශාඛා උපාසිකාව

(4) මෛත්‍රී භාවනාව (ලකුණු 2 x 5 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) 1 (02) 2 (03) 3 (04) 4 (05) 2 (06) ✓
(07) × (08) × (09) ✓ (10) × (11) පූර්වාරාමය (12) ජේතවනාරාමය
(13) අනත්ත ලක්ඛණ සූත්‍රය (14) සිඟාලෝවාද සූත්‍රය (15) ඛුද්දක නිකාය (16) 5
(17) 4 (18) 3 (19) 2 (20) 1 (ල. 20 x 20 = 40)

## II - කොටස

01 (i) * බුදුරජාණන් වහන්සේ තම දකුණු ශ්‍රී හස්තය පැවිදිවන කෙනා දෙසට දිගුකොට ''මහණ මෙහි එව''යි දේශනා කළ විට ඒ තැනැත්තාට සෘද්ධියෙන් සිවුරු පෙරවී සැට වයස් ගිය තෙරුන් වහන්සේ කෙනෙක් සේ සසුනට එක්වීම.
* බුදුරජාණන් වහන්සේට පමණක් විශේෂ වූ අසිරිමත් පැවිදි ක්‍රමයකි.

(ii) භද්‍ද වග්ගිය තෙරුන් වහන්සේලා / භද්‍ද වග්ගිය කුමාරවරු
(iii) අසරණ මහලු පියෙක් / වරදට හසුවූ නිවරද ගොවියෙක් / සෝපාක / සුනීත / පටාචාරා
(iv) දක්ෂ බව / අවංක බව ආදී (35 පිටුවේ සඳහන් ලක්ෂණ වලින් දෙකක් ලියා තිබිය යුතුය.)
(v) පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි
අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
(vi) අප මැනැවින් හික්මවීම / මැනැවින් ඉගැන්වීම / සියලු ශිල්ප ඉගැන්වීම / යහළු මිත්‍රාදීන්ට හඳුන්වාදීම / අපට රැකවරණය සැලසීම
(vii) අනෙත් අය කරන කියන දේ නොසැලී දරාගැනීමේ හැකියාව (සිසුවාගේ පිළිතුර සලකා බලන්න.)
(viii) බග දහමින් සසඳ
බැවින් බගවත් වීය මුනි සඳ
(ix) 1. සතුටින් ජීවත්වීමට හැකිවීම.
2. නිරෝගීමත් ප්‍රසන්න පුද්ගලයෙකු ලෙස ක්‍රියා කළ හැකි වීම
(33 පිටුව බලන්න. සිසුවාගේ නිර්මාණශීලී පිළිතුර සලකා ලකුණු ලබාදෙන්න.)
(x) සිරිත් - කළයුතු දේ විරිත් - නොකළයුතු දේ

02 (i) බිම්බිසාර රජතුමා
(ii) සත් සතිය ගතකිරීම / පළමු ධර්ම දේශනය පැවැත්වීම / පළමු ධර්ම දූත පිරිස ඇතිවීම (පෙළ පොතේ පළමු පාඩම බලන්න.)
(iii) පරාර්ථ චර්යාව / බුදුරජාණන් වහන්සේගේ මහා කරුණාව / මහා ප්‍රඥාව / සුදුසුසන්ට සුදුසු තැන ලබාදීම ආදී සුවිශේෂී ලක්ෂණ පිළිබඳ සලකා බලන්න. (පෙළ පොත පළමු පාඩම)

03 (i) අක්කොච්ඡි මං අවධිමං
අජිනි මං අහාසිමේ
යේතං උප නය්හන්ති
වේරං තේසං න සම්මති
(ii) අනුසෝතගාමී - යටිගං බලා යෑම
පටිසෝතගාමී - උඩුගං බලා යෑම
(iii) පෙළ පොතේ 55 පිටුව බලන්න. සිසුවාගේ පිළිතුර සලකා ලකුණු ලබාදෙන්න.

04 (i) විරතිය - අකුසලයෙන් වෙන්වීම
සමාදානය - කුසලයෙහි නිරතවීම
(ii) තමා වරදින් මිදීම / අන් අය ලවා වැරදි නොකරවීම / වරද අනුමත නොකිරීම හා ඊට අනුබල නොදීම
(iii) පෙළ පොතේ 60, 61 පිටු බලන්න.

05 (i) සුණාපරන්ත පුණ්ණ මහරහතන් වහන්සේ
(ii) පෙළ පොතේ 91 පිටුවේ තිබෙන ආනිසංස වලින් තුනක් ලියා තිබිය යුතු ය.
(iii) පෙළ පොතේ 89 පිටුව බලන්න. සිසුවාගේ නිර්මාණශීලී පිළිතුර සලකා ලකුණු ලබාදෙන්න.

06 (i) කිසියම් සමාජයක අන්‍යෝන්‍ය උපකාරය, සහයෝගය ඇතිව සමගියෙන් එක්ව ක්‍රියා කිරීම සහජීවනය නම් වේ.
(ii) මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා
(iii) පෙළ පොතේ 104, 105 පිටු බලන්න. සිසු පිළිතුරු සලකා බලා ලකුණු ලබාදෙන්න.

07 1. පෙළ පොත 96 පිටුව
2. පෙළ පොත 99 පිටුව
3. පෙළ පොත 45 පිටුව
4. පෙළ පොත 36 පිටුව